**ශීර්ෂය 112 - විදේශ කටයුතු අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

ශීර්ෂය 112 - විදේශ කටයුතු අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජූනි 07 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

## 2.1 විසර්ජන ගිණුම

### මුළු ප්‍රතිපාදනය හා වියදම

අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 10,106 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසානයට ඉන් රු.මිලියන 8,544 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 1,562 ක් හෙවත් සියයට 15 ක ප්‍රමාණයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 9,025 | 8,010 | 1,015 | 11 |
| මූලධන | 1,081 | 534 | 547 | 51 |
| එකතුව | 10,106 | 8,544 | 1,562 | 15 |

**2.2** අත්තිකාරම් ගිණුම

**2.2.1** රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාල විෂය අංක 11201 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 38.19 | 25.50 | 23.19 | 29.11 | 133.50 | 93.79 |

**2.3** අග්‍රිම ගිණුම්

අමාත්‍යාංශය යටතේ වූ අග්‍රිම ගිණුම් 5 ක 2015 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂ එකතුව රු.මිලියන 737 ක් විය. විස්තර පහත දැක්වේ.

| අග්‍රිම ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 7002/0000/00/0035/0010/000 | 97 |
| 7002/0000/00/0035/0011/000 | 14 |
| 7002/0000/00/0035/0012/000 | 73 |
| 7002/0000/00/0035/0013/000 | 84 |
| 7002/0000/00/0035/0015/000 | 469 |
| **එකතුව** | **737** |

**2.4 පොදුතැන්පත් ගිණුම්**

අමාත්‍යාංශය යටතේ වූ අග්‍රිම ගිණුම් 02 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 706 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0006/0071/000 | 32 |
| 6000/0000/00/0015/0025/000 | 674 |
| **එකතුව** | **706** |

**2.5 විගණන නිරීක්ෂණය**

විදේශ කටයුතු අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3 ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | **ලේඛන වර්ගය** | **අදාල රෙගුලාසිය** |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ආ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ඇ) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 |
| (ඈ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) |

**3.2 විගණන විමසුම්වලට පිළිතුරුදීම**

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී නිකුත් කරන ලද විගණන විමසුම 03 කට 2016 මැයි 30 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

**3.3 විසර්ජන ගිණුම**

**3.3.1 අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 09 ක් සඳහා සළසා තිබුණු එකතුව රු. මිලියන 172.82 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයම උපයෝජනය නොකර මුළුමනින්ම ඉතිරි කර තිබුණි.

(ආ) වැය විෂයයන් 06 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 69 ක සිට සියයට 89 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**3.4 අග්‍රිම ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශය විසින් 2016 අප්‍රේල් 30 දින වන විට පියවා නොතිබුණු අග්‍රිම ගිණුම් 05 කට අදාළ ශේෂවල එකතුව රු.මිලියන 365.37 ක් වී තිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව අග්‍රිම ගිණුමේ ශේෂය රු.මිලියන 737.22 ක් වුවද, එදිනට අමාත්‍යාංශයේ හා විදේශ දූත මණ්ඩල කාර්යාලවල නිරවුල් නොවූ අත්තිකාරම් ශේෂයන්, විදේශ දූත මණ්ඩලවල මුදල් ශේෂයන්, මාර්ගස්ථ මුදල් ශේෂයන් හා වෙනත් ගැලපීම්වල එකතුව රු.මිලියන 687.99 ක් වුයෙන් අග්‍රිම ගිණුමේ නොසැසඳුනු ශේෂය රු. මිලියන 49.23 ක් වී තිබුණි.

(ඇ) විදේශ දූත මණ්ඩල කාර්යාලවල 2016 අප්‍රේල් 30 දින වන විට නොපියවූ අත්තිකාරම්වල වටිනාකම රු.මිලියන 273.93 ක් වී තිබුණි. එම ලැබිය යුතු ශේෂවලින් රු.මිලියන 178.78 ක් වර්ෂ 1 ක සිට වර්ෂ 5 ක් දක්වාද, රු.මිලියන 58.80 ක ශේෂයක් වර්ෂ 5 කට සිට වර්ෂ 10 ක් දක්වාද හා රු.මිලියන 36.35 ක් වර්ෂ 10 ට වැඩි කාලයක් සිටද පැවත එමින් තිබුණි.

**3.5 පොදු තැන්පත් ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පොදු තැන්පත් ගිණුමේ වූ එකතුව රු.මිලියන 144.84 ක ශේෂයක් වර්ෂ 2 කට වැඩි කාලයක සිට පැවත එමින් තිබුණත්, එම ශේෂයයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව 2015 දෙසැම්බර් 31 දින වන විට කටයුතු කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 565(5) ප්‍රකාරව මාසික තැන්පතු සාරාංශ ප්‍රකාශ පිළියෙල කර ඊළඟ මාසය අවසානයට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) විදේශ සේවා නියුක්ති කාර්යංශයට අදාළ පොදු තැන්පත් ගිණුමේ රු.මිලියන 32.07 ක ශේෂයක් 2012 වර්ෂයේ සිට පැවත එමින් තිබුණද, එම ශේෂය 2015 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) උතුරු මිතුරු දුම්රිය මාර්ග ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 2.07 ක් ලැබී තිබුණත්, එම මුදල 2015 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) මුදල් රෙගුලාසි 565(2) ප්‍රකාරව පොදු තැන්පත් ලෙජරය යාවත්කාලීන කර නොතිබුණි.

(ඊ) විදේශ රටවල සේවයේ නියුතු ශ්‍රී ලාංකිකයින් ආපදාවන්ට හා මියයෑම්වලට ලක්වීම හේතුවෙන් එම රටවල උසාවි මගින් නියම කළ වන්දි මුදල් වශයෙන් රු.මිලියන 7.38 ක් ඔවුන් සේවය කළ ආයතන විසින් අමාත්‍යාංශය වෙත එවා තිබුණි. එම වන්දි මුදල් අදාළ හිමිකරුවන් වෙත ලබා නොදී විදේශ දූත මණ්ඩලවල පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

## 3.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 11201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීමට හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.මිලියන 6.69 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 1 ක සිට වර්ෂ 5 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණි. හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

(ආ) CC - 10 ලේඛනයේ ඇතුළත් රු. 104,286 ක් වූ ණයගැති ශේෂයක් සැසඳුම් ප්‍රකාශනයේ ණයගැති උපලේඛනයට ඇතුළත් කර නොතිබුණි.

(ඇ) බ්‍රසීලියා තනාපති කාර්යාලයේ සේවය හැරගිය සේවකයකුගේ 2015 ජනවාරි 01 දිනට රු.94,868 ක් වශයෙන් පැවති ණය ශේෂය ණයගැති ලේඛනයේ සඳහන් නොකර කාර්ය මණ්ඩල සේවකයකු ලෙස සැසඳුම් ප්‍රකාශයේ සඳහන් කර තිබුණි.

## 3.7 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 3.7.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් පිළියෙල කර අනුමත කර තිබූ ක්‍රියාකාරී සැලැස්මේ අමාත්‍යාංශයේ පවතින ක්‍රියාකාරී අංශ 14 ක් අතරින් මුදල් අංශය හා සාමාන්‍ය පරිපාලන අංශය ඇතුළුව අංශ 12 ක් පිළිබඳ තොරතුරු කිසිවක් ඇතුළත්කර නොතිබුණි.

### 3.7.2 විගණන හා කළමනාකරණ කමිටුව

අවම වශයෙන් කාර්තුවකට වරක් විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් පැවැත්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදි රැස්වීම් වාර 02 ක් පමණක් පවත්වා තිබුණි.

## 3.8 වත්කම් කළමනාකරණය

පොදු රාජ්‍ය මණ්ඩලීය නායක සමුළුව වෙනුවෙන් විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් කල්බදු වටිනාකම රු.මිලියන 55 ක් වටිනා අධි සුඛෝපභෝගී බස්රථ දෙකක් 2013 නොවැම්බර් 01 දින කල්බදු ක්‍රමය යටතේ ලබා ගෙන තිබුණි. ඒ සඳහා මාසිකව වාරික හා පොලී වශයෙන් රු.916,752 ක් බැගින් වාරික 60 කින් ගෙවීමේ එකඟතාවය මත ලබාගෙන තිබුණි. 2015 වර්ෂයේදී මෙම බස්රථ දෙක වෙනුවෙන් වාරික හා පොලිය පිළිවෙලින් රු. මිලියන 6.47 ක් හා රු.මිලියන 5.45 ක් වශයෙන් එකතුව රු.මිලියන 11.92 ක් ගෙවා තිබුණි. 2014 වර්ෂයේ සිට මෙම බස්රථ දෙක කිසිදු ප්‍රයෝජනයකින් තොරව අමාත්‍යාංශයේ රථගාලේ නිෂ්ක්‍රීයව පවතින බව නිරීක්ෂණය විය.

**3.9 අනුකූල නොවීම්**

**-------------------**

1990 මැයි 18 දිනැති අංක 26/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව රජයේ උත්සව කටයුතුවලදී මත්පැන්වලින් සංග්‍රහ කිරීම නොකළ යුතු බවත්, එම රීතිය තරයේ පිළිපැදිය යුතු වුවත්, ඉහත සඳහන් විධිවිධානවලට පටහැනිව වටිනාකම රු.මිලියන 2.69 ක් මත්පැන් සඳහා වැය කර තිබුණි.

**3.10 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

**------------------------------**

**විදේශ දූත මණ්ඩල සඳහා කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් පත් කිරීම.**

**---------------------------------------------------------------------------**

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විදේශදූත මණ්ඩලවල පවතින කළමනාකරණ සහකාර සේවයේ පුරප්පාඩු පිරවීම සඳහා විභාග කොමසාරිස්වරයා විසින් පවත්වන විභාගයක ප්‍රතිඵල මත සිදුකිරීම සාමාන්‍ය ක්‍රමවේදය වී තිබුණි. අමාත්‍යාංශය විසින් 2014/2015 වර්ෂයේ විභාග ප්‍රතිඵලවලින් පරිබාහිරව විදේශ දූත මණ්ඩල සේවය සඳහා නිලධාරීන් 14 දෙනෙකු පත්කර තිබුණි. උක්ත නිලධාරීන් 14 දෙනා අතරින් නිලධාරීන් 05 දෙනෙකු රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අයත් නොවන නිලධාරීන් වී තිබුණි.

(ආ) විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල සඳහා පෞද්ගලික සහකාරවරුන් ලෙස නිලධාරීන් 8 දෙනෙකු විභාග පටිපාටියෙන් තොරව 2015 වර්ෂයේ දී පත්කර තිබුණි.

**3.11 අවිධිමත් ගනුදෙනු**

**-------------------**

වතිකානු ධජ (3x6) 5975 ක් මිලදී ගැනීම සඳහා අමාත්‍යාංශයේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් ලංසු කැඳවා තිබුණි. අමාත්‍යාංශය විසින් ලංසු කැඳවීමේදී අවශ්‍ය ප්‍රමිතීන්, නිමවුම්වල ගුණාත්මක තත්ත්වය හා අමුද්‍රව්‍ය වර්ගය කුමක්ද යන්න ආදී පිරිවිතරයන් ඉදිරිපත් කර නොතිබුණි. අවම ලංසු ඉදිරිපත් කර තිබූ ආයතන විසින් ඉහත අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු නොකිරීම නිසා එම ලංසු ප්‍රතික්ෂේප කර තිබුණි. වැඩිම ලංසුව ඉදිරිපත් කර තිබූ ලංසුකරුට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර "ධජ" 5975 ක් රු.මිලියන 8.96 කට මිලදී ගෙන තිබුණි. මෙම ගනුදෙනුව වඩා තරගකාරීත්වයකින් යුතුව රජයට වාසිදායක වන පරිදි ඉටු කිරීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

**3.12 අනාර්ථික ගනුදෙනු**

**--------------------**

**ගමන් මළු වරායෙන් නිදහස් කර ගැනීම.**

**------------------------------------------**

ගමන් මළු වරායෙන් නිදහස් කර ගැනීමේදී ඒ සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් අමාත්‍යාංශය විසින් අනුගමනය කර නොතිබුණු බව පහත සඳහන් අඩුපාඩුවලින් නිරීක්ෂණය විය.

(අ) 2015 ජනවාරි 01 දින සිට 2015 ජූනි 30 දින දක්වා ගමන් මළු නිදහස් කර ගැනීමේදී ප්‍රමාද ගාස්තු ලෙස රු.578,335 ක් ගෙවා තිබුණි.

(ii) නිලධාරීන් ගමන් මළු රැගෙන ඒමේදී ඒ සඳහා කුලියට ගන්නා ලද බහළුම් වෙනුවෙන් තබා ඇති තැන්පතු නැවත අයකර ගැනීම හෝ නිෂ්කාශය නියෝජිතයාට ගෙවීම් කිරීමේදී අඩු කර ගැනීමට කටයුතු කළයුතු වුවත්, 2015 වර්ෂයේදී නිදහස් කර ගෙන ගෙවීම් කරන ලද බහළුම්වලට අදාළ තැන්පතු රු.15,000 ක් අයකර ගෙන හෝ ගෙවීම් කිරීමේදී අඩු කර ගෙන හෝ නොතිබුණි.

**3.13 මානව සම්පත් කළමනාකරණය (විදේශ දූත මණ්ඩල හැර)**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) ජ්‍යෝෂ්ඨ මට්ටම | 16 | 15 | 01 | - |
| (ii) තෘතියික මට්ටම | 07 | 03 | 04 | - |
| (iii) ද්විතියික මට්ටම | 359 | 281 | 78 | - |
| (iv) ප්‍රාථමික මට්ටම | 134 | 135 | - | 01 |
| **එකතුව** | **516** | **434** | **83** | **01** |